**#mediaethicsSL #SinhalaPress #EnglishPress #lka #Lankadeepa #SundayDivaina #Divaina #Ada # Dailymirror**

නුවර වැව රවුමේ රූගත කිරීමකට පැමිණි විදෙස් කණ්ඩායමක් සහ ප්‍රදේශවාසීන් අතර ඇතිවූ උණුසුම් තත්වයක් සම්බන්ධයෙන් පසුගියදා පුවත්පත් මගින් වාර්තා කොට තිබිණි. මෙහිදී ගැටළුව වී තිබුණේ විදේශික පිරිමින් දෙදෙනෙකු උඩරට මුල් ඇඳුම සහ ඔසරියෙන් සැරසී සිටීම වූ අතර, ඔවුන් එම ඇඳුමට අගෞරව වන ආකාරයකින් හැසිරුණු බවද පුවත්පත් මගින් වාර්තා කොට තිබිණි.

මෙහිදී විවිධ පුවත්පත් තුළ මෙම පුවත සම්බන්ධයෙන් පළවූ ලිපි සහ වාර්තාවන් හි සිරස්තල කිහිපයක් දෙස බැලූ විට පැනයක් මතුවේ. මෙම විදේශිකයින් සමරිසිභාවය ඇඟවෙන ආකාරයේ යම් ක්‍රියාවක් සිදුකරන්නට යෙදුණේද? එසේත් නැතිනම් තවත් පුවත්පතක් පළ කරනා ආකාරයට යම් කිසි ලිංගිකත්වය හැඟවෙන ආකාරයේ රංගනයක් සිදුකරන්නට යෙදුණේද? කෙසේ වෙතත් ප්‍රවෘත්ති අන්තර්ගතයන් මගින් එවැනි කිසිවක් සිදුවී ඇතැයි වාර්තා නොවේ.

එසේ නම් ඔවුන්ගේ රූගත කිරීම ලිංගිකත්වයට සම්බන්ධ වන බව හෝ සමරිසිභාවයට සම්බන්ධ වන බවට පුවත්පත් මගින් උපකල්පනය කරන්නට යෙදුණේ, පිරිමියෙකු විසින් කාන්තා ඇඳුමක් ඇඳීම යන කරුණ මුල්කරගනිමින්ද? එසේ නම් එය පාඨකයාව නොමඟ යවන සුළු වාර්තාකරණයක් නොවන්නේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?